
# දඟකාර අලි පැටියා



මෙතුලි තස්නිකා කරුණාරත්න

# දඟකාර අලි පැටියා

මෙතුලි තස්නිකා කරුණාරත්න

# දැගකාර අලි පැටියා

## මෙතුලි තස්නිකා කරුණාරත්න

| | | |
|---|---|---|
| ලිපිනය | : | නො: 65/64, |
| | | හේවාහැට පාර, |
| | | තල්වත්ත, |
| | | මහනුවර. |
| කතෘගේ වෙනත් කෘති | : | සෙල්ලම් ගෙදර |
| | | සිංදුයි බිංදුයි |
| | | පුංචි කුරුලු පවුල |
| ප්‍රථම මුද්‍රණය | : | 2023-11-15 |

# ~ පිදුම ~

මගේ ආදරණීය සමන්මලී ගුරුතුමියට

හා

මගේ පංතියේ සිටින සියළුම යෙහෙළියන්ට

ආදරයෙන් පුදමි.

# ~ ස්තූතිය ~

**මෙම පොත ලිවීමට**

**මට උදව් කළ හැම දෙනාටම**

**ස්තූතියි.**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟ පෙන්වීම  යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛන අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමාගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්“ ව්‍යාපෘතියට එක්වූ පූංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසල් කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය


මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

2023.11.01


එක කැලෑවක අලි පවුලක් ජීවත් වුණා. මේ අලි පවුලේ හිටියේ අලි අම්මයි, අලි තාත්තයි, අලි පැටියයි. මේ අලි පැටියනම් ටිකක් දඟයි අලි අම්මා කියන දේ අහන්නේ නෑ. ඒ වගේ ම අලි තාත්තා කියන දේත් අහන්නේ නෑ. අලි අම්මයි අලි තාත්තයි හරි දුකින් තමයි හිටියේ අලි පැටියා වැඩිහිටියන් කියන කිසි ම දෙයක් ඇහුවේ නෑ. අලි පැටියා කළේ එයාට හිතෙන දේවල්.




දවසක් දා අලි අම්මයි, අලි තාත්තයි, අලි පැටියයි ගඟකට නාන්න ගියා. එදා ගඟේ වතුර පාර ටිකක් සැරයි. අලි පැටියා ටිකක් දඟයිනේ එයාට ගඟේ නාන්න ම ඕන කිව්වා.



අලි අම්මටයි, අලි තාත්තටයි කිසි ම දෙයක් කරගන්නට බැරි වුණා. ඇයි අලි පැටියා ගඟේ නාන්න ම ඕනෑ කියලා අඬනවානේ ඉතින් ඊට පස්සේ මෙයාලා ටික වේලාවක් ගඟේ නාලා ගෙදර ගියා.



ඊළඟ දවසෙත් නාන්න ගියා. එදා තව ටිකක් වතුර පාර සැරයි. එදාත් අලි පැටියාට නාන්න ඕන කිව්වා. අලි අම්මටයි, අලි තාත්තටයි කිසිම දෙයක් කර ගන්නට බැරි වුණා. එදා ගොඩ වෙලාවක් ගඟේ නාලා තව සෙල්ලම් ගොඩකුත් කළා. අලි අම්මටයි, අලි තාත්තටයි දවස ගෙවෙනවා දැනුණේ නැහැ. දැන් අඳුර වැටෙන නිසා මෙයාලා ගෙදර ගියා.




ඊළඟ දවස උදා වුණා.

අලි පැටියා :- අම්මේ අපි අදත් නාන්න යමු අනේ.


අලි අම්මා :- හා පුතේ...

අලි තාත්තා :- හා පුතේ ...

අලි පැටියා :- යේ ...



අලි අම්මටයි, අලි තාත්තටයි අලි පැටියගෙ දඟ වැඩ නම් ඉවරයක් නෑ. ඒත් අකීකරුක ම නිසා අලි අම්මටයි, අලි තාත්තටයි, අලි පැටියා ගේ දිහා බලාගෙනම ඉන්න සිද්ධ වුණා. අලි අම්මයි, අලි තාත්තයි, අලි පැටියයි නාලා සෙල්ලම් කරලා ගෙදර ගියා. අලි අම්මාට හරියට නාගන්නවත් ඉඩක් ලැබුණේ නෑ.



ඊලඟ දවසේ උදේ ම මෙයාලා ගේ ගෙදර යාළුවෝ කට්ටියක් ආවා. අලි අම්මයි, අලි තාත්තයි එයාලත් එක්ක කතා කරකර හිටියා.

අලි පැටියා :- අද නම් ගඟට නාන්න යන්න බැරි වේවි, මෙයාලා යද්දි හවස් වේවි. ආ මම අද අම්මටයි, තාත්තටයි හොරෙන් යන්න ඕනෙ. අලි පැටියා ගෙදරින් එළියට ගියා


අලි පැටියා :- යේ මට දැන් යන්න පුළුවන් අලි පැටියා ගඟ ගාවට ගියා.



ගෙදර ආපු අය එක්ක කතා කර කර ඉද්දි අලි පැටියාව අමතක වුණා. කට්ටිය ගියාම අලි පැටියා ගෙදර හිටියේ නෑ. අලි අම්මයි, තාත්තයි හෙව්වා ඒත් හිටියේ නැහැ.




හනික ගඟ පැත්තට දුවගෙන ගියා එතකොටම අලි පැටියා මාව බේරගන්න කියලා කෑ ගහන හඬ ඇසුණා. අලි අම්මයි, අලි තාත්තයි ගඟ ගාවට ගියා අලි පැටියා ගිලෙන්නයි ගියේ එතකොටම අලි තාත්තා හොඬවැල දාලා පැටියාව එගොඩට ගත්තා.



අලි පැටියා :- මම ආයේ ඔයාලා කියන දේ අහනවා. මට සමාවෙන්න

අලි අම්මා, අලි තාත්තා:- අපි ආදරෙයි පැටියෝ.

ඉතින් ඊට පස්සේ මෙයාලා සතුටින් ජීවත් වුණා.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනාකරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතින් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023.11.01